**ශීර්ෂය 06 - රාජ්‍ය සේවා කොමිෂන් සභාව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2016 වර්ෂය**

ශීර්ෂය 06 - රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 ජුනි 02 දින කොමිෂන් සභාවේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම**

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

රාජ්‍ය සේවා කොමිෂන් සභාව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 344.15 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 283.48 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව කොමිෂන් සභාව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 60.67ක් හෙවත් සියයට 17.63 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| **වියදම** | **2016 දෙසැම්බර් 31 දිනට** | | | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ** |
|---|---|---|---|---|
| | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | **ප්‍රතිශතයක් ලෙස** |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 159.00 | 157.01 | 1.99 | 1.25 |
| මූලධන | 185.15 | 126.47 | 58.68 | 31.69 |
| **එකතුව** | **344.15** | **283.48** | **60.67** | **17.63** |

**2.2** **අත්තිකාරම් ගිණුම**

**2.2.1** **රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

කොමිෂන් සභාවට අදාළ විෂය අංක 00601යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 7.50 | 6.00 | 3.00 | 5.13 | 33.00 | 20.24 |

**2.3** **විගණන නිරීක්ෂණය**

කොමිෂන් සභාවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3.** **ප්‍රමාණාත්මක හා වැදගත් නිරීක්ෂණ**

**3.1** **වත්කම් කළමනාකරණය**

**වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව 2016 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා 2017 මාර්තු 17 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත්, කොමිෂන් සභාව 2017 මැයි 30 දින වන විටත් එම වාර්තා විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. අවසාන වශයෙන් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය 2015 වර්ෂය වෙනුවෙන් පවත්වා තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තාවලින් හෙළිදරව් කර තිබුණු අබලි භාණ්ඩ තොගයක් 2015 නොවැම්බර් 27 හා 2016 මැයි 26 දිනවලදී වෙන්දේසි කර තිබුණත්, එම වෙන්දේසිය පිළිබඳ තොරතුරු ඇතුළත් වාර්තා විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. ඒ හේතුවෙන් පොත්වලින් ඉවත් කරන ලද වත්කම් පිළිබඳව විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

## 3.2 දේශීය මූල්‍යකරණය මඟින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

**ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්**

කොන්ත්‍රාත්තුව නියමිත කාලය තුළ සාර්ථකව අවසන් කිරීමේ හැකියාව අදාළ සමාගම සතුව පවතින බවට කොමිෂන් සභාව සෑහීමකට පත්විය යුතුය යන කොන්දේසියක් සහිතව, කොමිෂන් සභාව සඳහා ස්ථිර ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ කාර්යය රු.මිලියන 417.83 ක් වූ කොන්ත්‍රාත් වටිනාකමකට මධ්‍යම ඉංජිනේරු සේවා පුද්ගලික සමාගම වෙත පිරිනැමීම අමාත්‍ය මණ්ඩලය අනුමත කර තිබුණි. ගිවිසුම ප්‍රකාරව දින 900 කින් ඉදිකිරීම් නිමකළ යුතු අතර 2015 ජනවාරි 02 දින වැඩ ආරම්භ කර තිබුණු බැවින් 2017 ජුනි 22 දින වැඩ නිම කළ යුතුව තිබුණි. නමුත් කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කර තිබුණු වැඩ සැලැස්මට අනුව වැඩ ඉටුකරවා ගැනීමට කොමිෂන් සභාව අපොහොසත්වී තිබීම හේතුවෙන් 2017 ජුනි 19 දින වන විටත් මූල්‍ය කාර්යසාධනය රු.මිලියන 278.42 ක් වී තිබුණි. තවද, භෞතික කාර්යසාධනය ඇස්තමේන්තු කර නොතිබුණි.

## 3.3 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 47 | 36 | 11 |
| (ii) | තෘතියික මට්ටම | 09 | 05 | 04 |
| (iii) | ද්විතියික මට්ටම | 112 | 86 | 26 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 52 | 44 | 08 |
| (v) | වෙනත් (අනියම් / තාවකාලික / කොන්ත්‍රාත් පදනම) | 03 | 03 | - |
| | **එකතුව** | **223** | **174** | **49** |

කොමිෂන් සභාව වෙත පැවරී ඇති කාර්යයන් ඉටු කිරීමේදී, පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය වෙත ඉදිරිපත් වන පැමිණිලි සහ ශ්‍රේෂ්ඨාධිකරණය හා අභියාචනාධිකරණය වෙත ඉදිරිපත් වන නඩු සම්බන්ධයෙන් වූ නෛතික කටයුතු ඉටුකළ යුතු නමුත්, අනුමත තනතුරු සංඛ්‍යාවේ ඇති එකම නීති නිලධාරී තනතුර ඇතුළු මාණ්ඩලික මට්ටමේ තනතුරු පුරප්පාඩු 11 ක්ද, වෙනත් තනතුරු පුරප්පාඩු 38 ක්ද, පිරවීමට කටයුතු කර නොතිබුණි.